ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# වාර්ෂික වාර්තාව



# 2014

# වාර්ෂික වාර්තාව

## 2014

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

41/1, නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත,

බත්තරමුල්ල.

දුරකථන අංකය: 011 2786495

ෆැක්ස් අංකය:011 2786493

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
41/1, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

2016 පෙබරවාරි මස 11 වන දින දී.

ගරු ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
මාලිගාවත්ත
කොළඹ 10.

මැතිතුමනි,

1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ ප්‍රතිපාදන යටතේ 2014 ජනවාරි මස 01 වන දින සිට 2014 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වූ ආයතනයේ කටයුතු සම්බන්ධ පහත වාර්තා මේ සමඟ ඉදිරිපත් කරමි.

- සභාපතිතුමාගේ සමාලෝචනය
- අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
- ආදායම් ප්‍රකාශය
- ශේෂ පත්‍රය
- විගණකාධිපතිගේ වාර්තාව

මෙයට - විශ්වාසී

නීතිඥ උපාලි මොහොට්ටි
සභාපති

# ආයතනික තොරතුරු

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| 1. | ජයන්ත චන්ද්‍රසෝම මහතා | - සභාපති |
| 2. | බී. තිස්ස මහානාම මහතා | - අධ්‍යක්ෂ |
| 3. | ලෙස්ලි වසන්ත ජයලත් මහතා | - අධ්‍යක්ෂ |
| 4. | පියසේන දොඩංගොඩආරච්චි මහතා | - අධ්‍යක්ෂ |
| 5. | එන්.එච්.ජේ.එම්. සේනාරත්න මහත්මිය | - අධ්‍යක්ෂ |
| 6. | එන්.ඩී. හෙට්ටිආරච්චි මහතා | - අධ්‍යක්ෂ |
| 7. | ආර්.එම්.පී. රත්නායක මහතා | - අධ්‍යක්ෂ |
| 8. | එන්.එම්.පී.එච්. සේනාරත්න මහතා | - අධ්‍යක්ෂ |
| 9. | ආචාර්ය එස්.ජී. සමරසුන්දර මහතා | - අධ්‍යක්ෂ |
| 10. | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | - අධ්‍යක්ෂ |
| 11 | ඉංජි. ඩී.ඩී.ආරියරත්න මහතා | - අධ්‍යක්ෂ |
| 12 | කේ.පී. විජේසූරිය මහත්මිය | - අධ්‍යක්ෂ |
| 13 | එල්.කේ.එස්.යූ. ධර්මකීර්ති මහතා | - අධ්‍යක්ෂ |

**ප්‍රධාන කාර්යාලය**

41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

**විගණක**

විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවෝ**

මහජන බැංකුව, බත්තරමුල්ල
ලංකා බැංකුව, පැලවත්ත

# සභාපතිගේ සමාලෝචනය

2014 දෙසැම්බර් 31 දිනට අවසන්වන වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

## හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 2014 ජනවාරි මස 01 දින සිට ආරම්භ වූ මාස 12ක කාල සීමාව තුළ පසුගිය වර්ෂවල මෙන්ම කාර්ය සාධනයෙහි දියුණුවක් පෙන්නුම් කරන ලදි.

## මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය

වගුව 1 - පසුගිය වර්ෂවල මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය

| වර්ෂය | මිරිදිය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය (මෙ.ටො.) | වෙරළබඩ ජලජීවී වගාව තුළින් ඉස්සන් නිෂ්පාදනය (මෙ.ටො.) | මුළු නිෂ්පාදනය (මෙ.ටො.) | පසුගිය වසරට වඩා නිෂ්පාදනයෙහි ඉහළ යාම ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| **2008** | 42,270 | 2,220 | 44,490 | 16 |
| **2009** | 43,010 | 3,550 | 46,560 | 2 |
| **2010** | 48,930 | 3,480 | 52,410 | 13 |
| **2011** | 55,410 | 4,150 | 59,560 | 14 |
| **2012** | 65,640 | 3,310 | 68,950 | 16 |
| **2013** | 62,480 | 4,430 | 66,910 | -3 |
| **2014** | 70,600 | 5,150 | 75,750 | 13 |

2014 වර්ෂයේ මිරිදිය ධීවර හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටොන් 75,750 ක් වූ අතර එම ප්‍රමාණය 2013 වසරට වඩා මෙ.ටොන් 8,840 ක, එනම් 13% ක වැඩි වීමකි. මේ සඳහා ප්‍රජා සහභාගිත්වයෙන් ජලාශ කළමනාකරණය, මත්ස්‍ය බීජ නිෂ්පාදනය, මත්ස්‍ය ඇඟිල්ලන් හා මිරිදිය ඉස්සන් පසු කිටයන් ජලාශ වල තැන්පත් කිරීම ඉවහල් වී ඇත. තව ද කිවුල්දිය ඉස්සන් වගාව ව්‍යාප්ත කිරීම, යහපත් කළමනාකරණ පුරුදු අනුගමනය කිරීම තුලින් රෝග පාලනය මගින් කිවුල්දිය ඉස්සන් නිෂ්පාදනය මෙම වසර තුල දී වැඩි වී ඇත. එමෙන්ම ජලාශ වල ජල මට්ටම පහල යාම ද මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වීමට හේතු වී ඇත.

## විදේශ විනිමය ඉපයීම හා ග්‍රාමීය ආර්ථිකය සඳහා දායකත්වය

2014 වසරේ මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් නිෂ්පාදන වටිනාකම රු. මිලියන 13,940 ක් පමණ ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එමඟින් ග්‍රාමීය ආර්ථිකයට අතිමහත් දායකත්වයක් කර ඇත. තවද

වගා කරන ලද ඉස්සන් සහ විසිතුරු මත්ස්‍ය අපනයනය තුලින් පිලිවෙලින් රු. මිලියන 3,375 ක් සහ රු. මිලියන 1,636 ක විදේශ විනිමයක් උපයා ඇත.

## මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය හා බෙදා හැරීම

2014 වසරේ දි උඩවලව, දඹුල්ල, ඉඟිණියාගල, පොළොන්නරුව සහ නුවරඑළිය ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇසිත්තන් සංඛ්‍යාව මිලියන 75.91කි. මෙම ඇසිත්තන්ගෙන් වැඩි ප්‍රමාණයක් මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම සඳහා පෞද්ගලික පොකුණු සහ ප්‍රජා පාදක සංවිධාන විසින් කළමනාකරණය කරන මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සඳහා නිකුත් කර ඇත.

වගුව 2 - ඇසිත්තන් නිෂ්පාදනය සහ බෙදා හැරීම (2008 - 2014) (මිලියන)

| නිෂ්පාදන ඒකක | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **2008** | **2009** | **2010** | **2011** | **2012** | **2013** | **2014** |
| **ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා** | 15.13 | 17.34 | 15.79 | 17.55 | 10.85 | 12.52 | 6.57 |
| **ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානවල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා** | 11.78 | 13.32 | 16.14 | 28.80 | 40.05 | 62.74 | 55.39 |
| **පෞද්ගලික පොකුණු හිමියන් සඳහා** | 11.34 | 17.99 | 26.31 | 34.88 | 24.39 | 21.94 | 11.93 |
| **කූඩු සඳහා** | 3.83 | 1.35 | 2.30 | 1.88 | 1.11 | 0.84 | 2.02 |
| **එකතුව** | **42.08** | **50.00** | **60.54** | **83.11** | **76.40** | **98.04** | **75.91** |

## මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය

2014 වර්ෂය තුළ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක හා පෞද්ගලික පොකුණු වල මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 40.98 ක් නිපදවන ලදි.

වගුව 3 - මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය (2008 - 2014) (මිලියන)

| නිෂ්පාදන ඒකක | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සඳහා | 6.60 | 8.14 | 8.03 | 8.47 | 5.63 | 5.76 | 4.27 |
| ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වල ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා | 6.70 | 9.62 | 13.75 | 20.35 | 21.18 | 34.94 | 30.94 |
| පෞද්ගලික පොකුණු හිමියන් සඳහා | 5.50 | 8.99 | 11.70 | 14.89 | 9.87 | 8.43 | 4.81 |
| කූඩු සඳහා | 2.00 | 1.18 | 1.40 | 1.11 | 0.71 | 0.26 | 0.96 |
| **එකතුව** | **20.80** | **27.93** | **34.88** | **44.82** | **37.39** | **49.39** | **40.98** |

## මත්ස්‍ය ඇඟිල්ලන් බෙදා හැරීම

ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන, පෞද්ගලික පොකුණු, ප්‍රජා මූලික මත්ස්‍ය නිෂ්පාදන ඒකක සහ කූඩු මඟින් 2014 වසරෙහි නිෂ්පාදනය කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් ජලාශවල තැන්පත් කිරීම පිළිබඳ විස්තර පහත පලවේ.

වගුව 4 - මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම - 2014

| ජලාශ වර්ගය | ජලාශ සංඛ්‍යාව | මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම (මිලියන) |
|---|---|---|
| විශාල පරිමාණ ජලාශ | 34 | 9.20 |
| මධ්‍යම පරිමාණ ජලාශ | 65 | 12.68 |
| කුඩා පරිමාණ ජලාශ | 190 | 11.03 |
| කාලීන ජලාශ | 265 | 3.28 |
| පොකුණු | 782 | 2.04 |
| ගංගා සහ කලපු | 07 | 0.51 |
| **එකතුව** | **1,343** | **38.74** |

## මිරිදිය ඉස්සන් පසු කිටයන් නිෂ්පාදනය

පම්බල හා කහඳමෝදර තිල්ලවටවන පිහිටි අභිජනනාගාර මඟින් 2014 වසර තුළ මිරිදිය ඉස්සන් පසු කිටයන් මිලියන 10.59ක් නිපදවන ලද අතර අදාල වර්ෂය තුල දි තැන්පත් කිරීම් පහත දක්වා ඇත.

වගුව 5 - මිරිදිය ඉස්සන් පසු කිටයන් තැන්පත් කිරීම - 2014

| ජලාශ වර්ගය | ජලාශ සංඛ්‍යාව | තැන්පත් කරන ලද පසු කිටයන් (මිලියන) |
|---|---|---|
| **විශාල පරිමාණ ජලාශ** | 13 | 5.32 |
| **මධ්‍යම පරිමාණ ජලාශ** | 19 | 2.10 |
| **කුඩා පරිමාණ ජලාශ** | 19 | 2.22 |
| **පොකුණු** | 48 | 0.22 |
| **කලපු** | 01 | 0.06 |
| **එකතුව** | **100** | **9.92** |

ජලාශවල මිරිදිය ඉස්සන් නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන් වර්ධනයක් පෙන්නුම් කරන අතර මෙය ධීවරයන්ගේ ආදායම් ඉහළ යාමට හේතු වී ඇත. ජලාශවල මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2014 වසර තුල මෙට්‍රික්ටොන් 460ක් පමණ වූ අතර එමඟින් ග්‍රාමීය ආර්ථිකයට කරනු ලැබූ දායකත්වය රුපියල් මිලියන 368 ක් පමණ වේ. මිරිදිය ඉස්සන් ජාලග ආශ්‍රිතව නව ධීවර කර්මාන්තයක් බිහි කර ඇති අතර මේ සඳහා අපනයන වෙළඳපලක් ද ඇති වී ඇත. මේ වනවිට ආයතන දෙකක් මිරිදිය ඉස්සන් අපනයනය කරන අතර මෙ. ටොන් 21.36, 20.68 සහ 141 ක් පිළිවෙලින් 2012, 2013 සහ 2014 වර්ෂ වල අපනයනය කර ඇත.

## නොමිලයේ මත්ස්‍ය පැටවුන් නිකුත් කිරීමේ වැඩසටහන

2008.07.16 දින දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව වසර පහක කාලයක් සඳහා මත්ස්‍ය පැටවුන් නිකුත් කිරීමේ වැඩ සටහන 2009 වසරෙහි දී ආරම්භ විය. මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 150.0 ක් වෙන් කර තිබුණි. 2014 වර්ෂයේ මේ සඳහා රුපියල් මිලියන 30.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි.

මෙම වැඩසටහන යටතේ මත්ස්‍ය ඇඟිල්ලන් සහ මිරිදිය ඉස්සන් පසු කිටයන් මිලියන 27.70 ක් 2014 වසර තුළ ජලාශවල තැන්පත් කර ඇත.

## ජලාශවල ධීවර කළමනාකරණ කටයුතු

නිත්‍යානුකූල නොවන ධීවර ආම්පන්න භාවිතය වලක්වා ජලාශවල මිරිදිය ධීවර කටයුතු නියාමනය සහ කළමනාකරණය කිරිම සඳහා අප අධිකාරිය 2014 වසර තුළ වැටලිම් 315 ක් සිදුකර ඇත. මීට අමතරව කළමනාකරණ බලපත්‍ර 356ක් ද මිරිදිය ධීවර කර්මාන්තය සඳහා යාත්‍රා 400 ක් සහ ධීවර ආම්පන්න කට්ටල 804 ක් ලබා දී ඇත.

## ජාතික මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනය, කලාවැව

2014 වසර තුල මෙම ආයතනය පුහුණු පාඨමාලා 116 ක් පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලද අතර උපයන ලද ආදායම රුපියල් මිලියන 15.11 කි.

## ඉස්සන් වගා කර්මාන්තය

සුදුපුල්ලි රෝගය හේතු කොටගෙන හානියට පත්වූ ඉස්සන් වගා කර්මාන්තය පුනරුත්ථාපනය කිරිම සඳහා පසුගිය වසර කිහිපය තුළ විවිධ වැඩසටහන් ඉස්සන් ගොවිපල අධීක්ෂණ ඒකකය මඟින් ක්‍රියාත්මක කරන ලදි. එකී ක්‍රියාකාරකම් අතර ලන්දේසි ඇල හැරීම, කලාප වෙන් කිරීම සහ වගා කාල සටහන් හඳුන්වා දිම, අවශ්‍ය රෙගුලාසි සකස් කිරිම හා ක්‍රියාත්මක කිරීම, ඉස්සන් අභිජනනාගාර නියාමනය සහ ඉස්සන් පසු කීටයන් සහ මව් ඉස්සන් පරීක්ෂාවට යටත් කිරිම ද ප්‍රධාන වේ. ඒ හැරුණු විට බත්තුළුඔය පිහිටි ඉස්සන් රෝග නිර්ණය සහ සෞඛ්‍ය කළමනාකරණ විද්‍යාගාරය ඉස්සන් වගා කරුවන් සඳහා රෝග නිර්ණයනය සඳහා සේවා සපයනු ලබයි.

ජලජීවී වගා කළමනාකරණ බලපත්‍ර 469 ක් නිකුත් කරන ලද අතර මින් 444 ක් ඉස්සන් ගොවිපල සඳහා ද 20ක් ඉස්සන් අභිජනනාගාර සඳහා ද 05ක් මව් ඉස්සන් එකතු කරන්නන් සඳහා ද නිකුත් කරන ලදි. නැක්ඩා ආයතනය 2014 වසර තුල ඉස්සන් පසු කිටයන් සහ මව් මත්ස්‍යයින්ගේ රෝග සඳහා PCR පරීක්ෂණ 4071 ක් සිදුකර ඇති අතර ඉස්සන් අභිජනනාගාරවල ජලයේ ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ජල සාම්පල 20 ක් ද පරීක්ෂාවට භාජනය කරන ලදි.

2014 වසරෙහි දි පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් අභිජනනාගාර 43 ක් සහ ඉස්සන් ගොවිපල 527 ක් ක්‍රියාත්මක විය. අදාල වර්ෂය තුළ ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය මිලියන 330 කි.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට ඉස්සන් වගාව පොකුරු වගා ක්‍රමය යටතේ ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන ඇත. මඩකලපුව දිස්ත්‍රික්කය තුල ඉස්සන් වගාව බිම් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී.

## මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාව සංවර්ධනය කිරීම

මෙම අභිජනනාගාරය රාජ්‍ය - පෞද්ගලික ව්‍යවසායයක් යටතේ 2011 දී නිෂ්පාදන ආරම්භ කල අතර මෙමගින් මඩකලපුව ප්‍රදේශයේ සඳහා අවශ්‍ය පසු කිටයන් සැපයීම සිදුකරනු ඇත. පෞද්ගලික සමාගමක් මෙම අභිජනනාගාරය පවත්වාගෙන යන අතර 2014 දී ඉස්සන් පැටවුන් මිලියන 20.45 නිෂ්පාදනය කර ඇත. තවද මඩකලපුව දිස්ත්‍රික්කයේ ව්‍යාප්ත වෙමින් පවතින ඉස්සන් වගා කර්මාන්තය සදහා අවශ්‍ය *කිවුල්දිය ඉස්සන්* පසු කිටයන් අවශ්‍යතාවය සපුරාලීමට නැගෙනහිර පළාතේ ස්ථාපිත එකම අභිජනනාගාරය වේ.

වාකරේ ප්‍රදේශයේ සුනාමියේ බලපෑමට ලක්වූ පවුල් සඳහා පොකුරු ක්‍රමයට ඉස්සන් වගා කිරීම තුලින් ජිවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදි. අධිකාරිය විසින් පහසුකම් සලසා දුන් මඩකලපුව, වාකරේ පිහිටා ඇති පොකුරු ඉස්සන් වගා ගොවිපල, පරිසර හිතකාමී වූත් තිරසාර වූත් කිවුල්දිය ඉස්සන් වගාව සඳහා ආදර්ශ ගොවිපලකි. ප්‍රතිලාභීන් සහ ආයෝජකයකු අධිකාරිය සහ වාකරේ දිස්ත්‍රික් ලේකම් විසින් තෝරා ගත් අතර සියළුම ප්‍රතිලාභීන් සාමාජිකත්වය දරන ජලජීවී සංවර්ධන සංගමයක් පිහිටුවා එය අධිකාරියේ ලියාපදිංචි කරන ලදි. ආයෝජක ආයතනය සහ සංගමය කොටස්කරුවන් වන සේ Vakarai Ocean Aqua Cluster (Pvt) Ltd ආයතනය පිහිට විය. මෙම පොකුරු ඉස්සන් වගා ගොවිපල Vakarai Ocean Aqua Cluster (Pvt) Ltd යටතේ ක්‍රියාත්මක වේ. 2014 වගා චක්‍රය සදහා ආයතනය විසින් රු. මිලියන 5.40 ලාභයක් ඉපැයූ අතර සෑම ප්‍රතිලාභියකු සඳහා රු. 200,000.00 ක ලාභයක් ලැබුණි.

මඩකලපුව ගුවන් හමුදා කඳවුර තුල පිහිටා ඇති මෙම ප්‍රදර්ශක ගොවිපල උපයෝගී කරගෙන ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ ප්‍රදේශයේ ඉස්සන් වගා කරුවන්ගේ යහපත් කළමනාකරණ පුරුදු සහ තිරසාර ඉස්සන් වගාව පිළිබඳව පුහුණු කරනු ලැබේ. දැනට මෙම ප්‍රදර්ශක ගොවිපල මඩකලපුව ගුවන් හමුදා කඳවුර මඟින් කළමනාකරණය කරනු ලැබේ. 2014 වසරේ මෙ. ටොන් 5.2 ක අස්වැන්නක් ලබා ගත් අතර තව ද මේවන විට 200 දෙනෙකු පුහුණු කර ඇත.

## විසිතුරු මසුන් සහ ජලජ පැලෑටි වගාව

නැක්ඩා ආයතනය විසින් මසුන්ගේ නව ප්‍රභේද බිහිකිරීම, තාක්‍ෂණ සංවර්ධනය, මව් මසුන් සැපයීම, මත්ස්‍ය රෝග නිර්ණයන, පුහුණුව සහ තාක්‍ෂණ උපදෙස් සැපයීම යනාදිය මඟින් විසිතුරු මසුන් හා ජලජ පැලෑටි වගාව මෙන්ම අපනයන සඳහා සහාය වෙනු ලබයි. රම්බඩගල්ල සහ ගිණිගත්හේන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන විසිතුරු මසුන් සහ ජලජ පැලෑටි වගාව සංවර්ධනයට අදාල කාර්යයන් සඳහා වෙන්කර ඇත. මෙම මධ්‍යස්ථාන මඟින් විසිතුරු මසුන් මිලියන 1.33 ක් ගොවීන්ට හා අපනයන කරුවන්ට අළෙවිකර රුපියල් මිලියන 7.99 ක් උපයන ලදි. මව් මසුන් 542,632 ක්ද මෙම වර්ෂය තුළ සපයා ඇත. අදාල වර්ෂය තුළ පුහුණු පාඨමාලා 30ක් පවත්වන ලද අතර ඒ මඟින් විසිතුරු මසුන් වගා ක්ෂේත්‍රයේ 1087 දෙනෙකු පුහුණු කර ඇත.

විසිතුරු ජලජ පැලෑටි පටක රෝපණය සඳහා රම්බඩගල්ල මධ්‍යස්ථානයේ පටක රෝපණ විද්‍යාගාරයක් පිහිටුවා ඇත. මෙහි මූලික අරමුණ වනුයේ තාක්ෂණික සහ ජලජ පැලෑටි අපනයනය තුලින් විදේශ විනිමය ඉපයීමය.

Live rock අපනයනය අපගේ නිෂ්පාදන පරාසය සඳහා නව එකතුවීමක් වන අතර 2014 වර්ෂයේ දී රුපියල් මිලියන 6.2 ක වටිනාකමකින් යුත් Live rock අපනයනය කර ඇත.

## දිවි නැගුම වැඩසටහන 2011-2014

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඉහත වැඩසටහන යටතේ නැක්ඩා ආයතනය මගින් පහත ව්‍යාපෘති ආරම්භ කර ඇත.

- පොකුණු තුල මත්ස්‍ය ඇසිත්තන් ඇගිල්ලන් දක්වා වර්ධනය කිරීම
- ආහාරය පිණිස පොකුණු තුල මත්ස්‍ය වගාව
- විසිතුරු මත්ස්‍ය වගාව
- ඒකාබද්ධ මත්ස්‍ය වගාව
- කාලීන ජලාශ වල මත්ස්‍ය වගාව
- වතු ජලාශ වල මත්ස්‍ය වගාව
- බෙල්ලන් වගාව
- මොදා මත්ස්‍ය වගාව
- පවතින කුඩා පරිමාණ විසිතුරු මත්ස්‍ය ගොවිපල වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

පෝෂණය සපයා ගැනීම සහ අමතර ආදායමක් උපයා ගැනීම සඳහා ජලජීවී වගාවේ නියැලීමට ගෘහස්ත මට්ටමින් කැමැත්තක් දක්වන්නන් සඳහා මූල්‍යමය ආධාර ක්‍රමයක් ලෙසට මෙම වැඩසටහන බවට පත්ව ඇත.

මෙම වැඩසටහන යටතේ පොකුණු තුල මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම, ආහාරය පිණිස මත්ස්‍ය වගාව, විසිතුරු මත්ස්‍ය වගාව සහ ඒකාබද්ධ මත්ස්‍ය වගාව සඳහා කුඩා පරිමාණ ව්‍යවසායකයින් 5,319 දෙනෙකු සඳහා සහාය ලබා දී ඇත. මෙම කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍යමය , තාක්ෂණික සහාය සහ පුහුණුව ලබා දී ඇත. දිවි නැගුම වැඩසටහන යටතේ මේ දක්වා හෙක්ටයාර 14,200ක් පමණ කාලීන ජලාශ වල මත්ස්‍ය වගාව සඳහා යොදා ගැනුනි.

වතුකරයේ ජනතාවගේ සහභාගිත්වයෙන් වතු තුල පොකුණු තුල මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. වතුකරයේ ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වන අතර තව ද එම ජනතාවගේ ආදායම ඉහල නැංවීම මෙමඟින් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන 2014 වසර තුල නුවරඑළිය, නුවර, මාතලේ සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

## සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාවන්

- **මුහුදු කූඩැල්ලන් වගාව**

  කොටු සහ පොකුණු වල මුහුදු කූඩැල්ලන වගාව සඳහා අප ආයතනය පහසුකම් සපයා ඇති අතර පෞද්ගලික අංශය විසින් තේවාන්පිට්ටි, අම්බුපුරම්, වලෙයිපාඩු සහ නාච්චිකුඩා යන ප්‍රදේශ වල කොටුතුල මුහුදු කූඩැල්ලන් තර කිරීම ආරම්භ කර ඇත.

- **මුහුදු පැළෑටි වගාව**

  අප විසින් මුහුදු පැළෑටි වගාව පිලිබඳ තාක්ෂණය ලබා දීම සඳහා උතුරු පළාතේ වලේපාඩු ප්‍රදේශයේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි. ප්‍රධාන පෙළේ පෞද්ගලික සමාගමක් ප්‍රජා සහභාගිත්වයෙන් උතුරු පළාතේ වානිජ මට්ටමින් මුහුදු පැළෑටි වගාව ආරම්භ කර ඇත. මේ යටතේ වගාකරුවන් 300 දෙනෙකු මුහුදු පැළෑටි වගාව ආරම්භ කර ඇත.

- **මොදා අභිජනනය**

රාජ්‍ය - පෞද්ගලික ව්‍යවසායයක් යටතේ මොදා මත්ස්‍ය අභිජනනය සාර්ථක කර ගැනීමට හැකි විය. පෞද්ගලික අභිජනනාගාරයක මොදා මත්ස්‍ය අභිජනනය සඳහා තාක්ෂණික සහය ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන ලදි. මෙය ශ්‍රී ලංකාව තුල මොදා මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරීම සඳහා මග පාදනු ඇත. 2014 වර්ෂයේ මොදා පැටවුන් 250,000 නිෂ්පාදනය කර ඇත.

- මොදා මත්ස්‍ය වගාව

මීගමුව කළපුව, ත්‍රිකුණාමලය, ගාල්ල, හා පුත්තලම යන දිස්ත්‍රික්කවල මොදා මත්ස්‍ය වගාව සඳහා පුද්ගලික අංශය යොමු වී ඇත. මේ වනවිට වගාකරුවන් 55 දෙනෙකු පමණ පොකුණු හා කූඩු තුල මොදා මසුන් වගාවේ නියැලී සිටී. 2014 වර්ෂයේ මොදා මෙ.ටොන් 43 ක අස්වැන්නක් ලබා ගෙන ඇත.

ඇමරිකානු ඩොලර් මිලියන 04 ක වියදමින් මහා පරිමාණ කූඩු තුල මොදා මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පෞද්ගලික සමාගමක් විසින් ත්‍රිකුණාමල මුහුදේ ආරම්භ කරන ලදි. වානිජ මට්ටමින් මුහුද ආශ්‍රිත මත්ස්‍ය වගාව රටට හඳුන්වා දීම මෙමගින් සිදුවේ. තවද මෙම ව්‍යාපෘතිය මගින් ඍජු රැකියා ඇති කිරීම තුලින් වෙරළබඩ ජනතාවගේ ජීවනෝපාය ඇති කිරීම, ස්වාභාවික මත්ස්‍ය ගහණය වෙත වන බලපෑම අවම වීම, නොකඩවා මත්ස්‍ය නිෂ්පාදනය අපනයන වෙළඳපලට සැපයීම මගින් විදේශ විනිමය වැඩි කිරීම, සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීම බලාපොරොත්තු වේ.

**<u>තාක්ෂණ සහාය සහ ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව සංවර්ධන සඳහා ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර අවබෝධතා ගිවිසුම</u>**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මුහුදු කැකිරි අභිජනනය හා වගාව, මුහුදු පැළෑටි වගාව සහ පොකිරිස්සන් තර කිරීම සඳහා තාක්ෂණය සහ සහාය ලබා දීමය. මෙම ව්‍යාපෘතිය යටතේ වියට්නාම් විශේෂඥයින් සහභාගීත්වයෙන් නියමු ව්‍යාපෘති ආරම්භ කර නිලධාරීන් හා වගාකරුවන් වෙත තාක්ෂණය ලබා දීම සහ පුහුණුවු ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි. 4.55 කි.

පහත ස්ථාන වල නියමු ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

- මුහුදු පැළෑටි වගාව - වලේපාඩු

  මෙ. ටොන් 70 ක අස්වැන්නක් 2014 වසර තුල දී ලබා ගෙන ඇත.

- මුහුදු කැකිරි අභිජනනාගාරය - අඹකදවිල, හලාවත

  2014 වසර තුල දී පැටවුන් 424,000 නිෂ්පාදනය කර ඇත.

- පොකුණු තුල මුහුදු කැකිරි වගාව -පුලින්චිකුලම

  කි. ග්‍රෑම් 595.2 ක අස්වැන්නක් 2014 වසර තුල දී ලබා ගෙන ඇත.

- කොටු තුල මුහුදු කැකිරි වගාව - කිරන්චි

- පොකිරිස්සන් තර කිරීම - වලේපාඩු

  කූඩු 4ක් තුල පොකිරිස්සන් 290 ක් තැන්පත් කර ඔවුන්ගේ වර්ධනය අධීක්ෂණය කරමින් පවතී.

## ඉරණමඩු ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන

ඉරණමඩුව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර මේ සදහා ඇස්තමේතුගත වියදම රු.මි. 400කි. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම තුලින් පෝෂණ මට්ටම සහ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සදහා උතුරු පලාතේ ජලාශ වලට මත්ස්‍ය ඇගිල්ලන් ලබා දීම මෙහි අරමුණු වේ.

රටපුරා විසිරී සිටින මිරිදිය ධීවරයන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නංවාලීම සඳහා සෑම අවස්ථාවකම කැපවීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ කාර්යය මණ්ඩලයේ කර්තව්‍යයන් ඉතා ඉහලින් අගයන අතර ඔවුන් දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් සභාපති සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ස්තුතිය හිමිවේ. ඒ සමගම ආධාර ලබාදෙන ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ පළාත් සභා, ජලාශ ධීවර සංවිධාන සඳහා මත්ස්‍ය බීජ සැපයීම සඳහා අරමුදල් සැපයීමෙන් දක්වන ලද සහයෝගය මෙහිදී විශේෂයෙන් සඳහන් කරමු. එමෙන්ම ජලජීවී වගාවේ වගා කරුවන්, ඉස්සන් වගා කරුවන්, අපනයන කරුවන් සහ අනෙකුත් අනුග්‍රාහකයන්ටද අපගේ ස්තුතිය පල කරමු.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර හා ජලජීවී වගාවේ සංවර්ධනය සඳහා දක්වන ලද මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් අපගේ ස්තුතිය පල කරමු. අධිකාරියේ කටයුතු සඳහා නිරන්තරයෙන් දක්වන ලද සහාය වෙනුවෙන් අමාත්‍යාංශ ලේකම්තුමා සහ කාර්යය මණ්ඩලයටත්, ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි කාර්යය සඳහා මූල්‍ය සහාය ලබාදුන් මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාට ද අපගේ විශේෂ ස්තුතිය හිමිවේ.

**සභාපති**
ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව විගණනය කරන ලද ගිණුම්ද සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

# 1. හැඳින්වීම

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති ජලජීවී වගා අංශය 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත මඟින් 1999 ජනවාරි මස 29 වන දින පටන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (නැක්ඩා - NAQDA) බවට පත් කරන ලදි. ආරම්භයේදි ප්‍රධාන කාර්යාලය කොළඹ 10, ටි.බී ජායා මාවතේ අංක 307 1/1 යන ස්ථානයෙහි කුලියට ලබාගන්නා ලද ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදි. එය 2003 වසරේ සිට කොළඹ 09, බේස්ලයින් පාර පිහිටි ගොඩනැගිල්ලකට ගෙනයන ලද අතර 2010 ජනවාරි මාසයේදි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල,පැලවත්තේහි පිහිටි අධිකාරිය සඳහා ඉදිකල නව ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ලකට ගෙන එන ලදි.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය සිදු කරනු ලබයි. අධිකාරිය ප්‍රධාන වශයෙන් මිරිදිය ජලජීවී වගා සංවර්ධන, වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන, ව්‍යාප්ති, මුදල් සහ මානව සම්පත් සංවර්ධන වශයෙන් අංශ 5කින් හා අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වේ.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන (AQDC)**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් ප්‍රධාන මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන (AQDC) හයක් (06) , මිරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන දෙකක් (02) සහ විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන දෙකක් (02) පහත ආකාරයට පවත්වා ගෙන යනු ලබයි.

| <u>**මධ්‍යස්ථාන**</u> | <u>**නිෂ්පාදන විශේෂයන්**</u> |
|---|---|
| ➢ උඩවලව (කාප්) | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් |
| ➢ දඹුල්ල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, චීන කාප් |
| ➢ ඉඟිණියාගල | සාමාන්‍ය කාපයා, ඉන්දියානු කාප්, තිලාපියා |
| ➢ නුවරඑළිය | සාමාන්‍ය කාපයා |
| ➢ උඩවලව (තිලාපියා) | තිලාපියා විශේෂ |
| ➢ පොළොන්නරුව | ඉන්දියානු කාප්, චීන කාප්, තිලාපියා |

- පම්බල | මිරිදිය ඉස්සන්
- තිල්ලවටවන (කහඳමොදර) | මිරිදිය ඉස්සන්
- රම්බඩගල්ල | විසිතුරු මත්ස්‍ය අභිජනනනය සහ වර්ධනය සහ ඉහත විෂයයන් සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ගිනිගත්හේන | විසිතුරු මත්ස්‍ය අභිජනනාගාර හා වගාව

ඉහත සියලු මධ්‍යස්ථානයකම ජලජීවී විද්‍යාඥවරයකු ස්ථානභාර නිළධාර වශයෙන් කටයුතු කරන අතර, ඔවුන්ගේ වගකීම වන්නේ දිවයින පුරා පිහිටි ජලාශවල තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ නිෂ්පාදනය කිරීමයි.

**කලාවැව - ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනය (NIFATI)**

මෙම ආයතනය ජලජීවී වගා අධිකාරියේ කාර්ය මණ්ඩලය, මිරිදිය ධීවරයන්, මසුන් වගා කරන්නන්, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා මූලික සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශව සඳහා මිරිදිය ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයට අදාල පුහුණුවීම් පවත්වනු ලබයි. එයට අමතරව  රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීමද සිදුකරන අතර ආයතනය සහකාර අධ්‍යක්ෂ (පුහුණු) යටතේ පාලනය වේ.

**ව්‍යාප්ති අංශය**

ප්‍රාදේශීය ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල සහ දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති කාර්යාල 22ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ (පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්). ප්‍රාදේශීය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන් ව්‍යාප්ති කටයුතු , රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කටයුතු , ජලජ සම්පත් කළමණාකරනය එනම් ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම, ධීවරයින් දැනුවත් කිරීමේ කටයුතු හා අනවසර ධීවර කටයුතු වැලැක්වීම සහ තාක්ෂණය ලබා දීමේ කටයුතු සිදුකරනු ලබයි.

## 2. <u>අරමුණු</u>

නැක්ඩා ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ විධිමත් මඟපෙන්වීම තුලින් ජලජීවී වගා සංවර්ධනයට අවශ්‍ය රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ සංවර්ධනයන්, පුහුණු කිරීම් හා ව්‍යාප්ති කටයුතු යනාදී ක්‍රමවේදයන් තුලින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගාවේ

තිරසාර සංවර්ධනයයි. මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුලින් ආර්ථික සංවර්ධනය, ජනගහනයේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම, අපනයන වෙළඳපොලට ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය විශේෂ ඉදිරිපත් කිරීම සහ රැකියා අවස්ථා බහුල කිරීමෙන් සහ ආදායම් තත්ත්වය ඉහල දැමීම තුලින් දිලිදුකම අඩුකිරීම නැක්ඩා ආයතනයේ අනෙකුත් අරමුණු වේ.

15/09/2011 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛන අංක 58(2) අනුව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ප්‍රවර්ධන ආයතනයක් (Promotional Institute)ලෙස වර්ගීකරණය කර ඇත.

## 3. 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මිනිස් බලය පිළිබඳ තොරතුරු

| කාණ්ඩ | | සංඛ්‍යාව |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්** | | **05** |
| **මධ්‍ය මට්ටමේ කළමණාකරුවන්** | | **09** |
| **කණිෂ්ට මට්ටමේ කළමණාකරුවන්** | | **59** |
| ජලජීවී විද්‍යාඥයින් | 34 | |
| ප්‍රාදේශිය/දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරින් | 17 | |
| සංඛ්‍යා ලේඛන නිළධාරින් | 03 | |
| පරිඝණක විශ්ලේෂක | 01 | |
| මුල්‍ය නිළධාරින් | 01 | |
| පරිපාලන නිළධාරින් | 01 | |
| මිලදී ගැනිමේ නිළධාරින් | 01 | |
| සමාජ සංවර්ධන නිළධාරින් | 01 | |
| **කළමණාකාර සහකාර - තාක්ෂණික** | | **75** |
| ජලජීවී වගා සහකාර | 14 | |
| ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරින් | 58 | |
| තාක්ෂණික නිළධාරින් | 02 | |
| පොත් තබන්නන් | 01 | |
| **කළමණාකාර සහකාර - තාක්ෂණික නොවන** | | **69** |
| **ප්‍රාථමික මට්ටම** | | **309** |
| විදුලි/ යන්ත්‍ර කාර්මික | 04 | |
| රියදුරු | 32 | |
| සුළු සේවකයින් | 273 | |
| **එකතුව** | | **526** |

## 4. ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වන්නේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ මිරිදිය මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරිම, රැකියා අවස්ථා බිහි කිරිම, ජලජ සම්පත් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ප්‍රමාණය වැඩි කිරිම ඉලක්ක කර ගෙන ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සහ ජලජීවී වගා කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ කළමනාකරණය කිරිමයි.

## 5. ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය 100% ක් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධනය ආයෝජනය කරනු ලබන රජයේ අයතනයකි. මෙහි අනුමත මුලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 90 කි.

## 6. ආදායම්

මත්ස්‍ය බීජ විකිණිමෙන්, මධ්‍යස්ථාන බදුදිමෙන් හා අනෙකුත් ආදායම් වශයෙන් අධිකාරිය ලබා ඇති ආදායම රුපියල් මිලියන 100.45 ක් වේ. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම් පියවිම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 215.20 ක් වේ.

## 7. අධිකාරියේ ක්‍රියාකාරකම්

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 26.33 ක ශුද්ධ පාඩුවක් ලබා ඇත. ආදායම් විස්තර පිටු අංක 24 යටතේ දක්වා ඇත.

## 8. කාර්යයන් පිළිබඳ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 වන දිනට අධිකාරියේ ශේෂ පත්‍රය 21 වන පිටුවෙහි දක්වා ඇත.

## 9. ප්‍රාග්ධන වියදම්

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙනුවෙන් 2014 වර්ෂයේ දී රුපියල් මිලියන 95.0 ක මුලය ප්‍රතිපාදන වෙන්කර දි ඇත. මෙම සම්පූර්ණ වෙන් කල ප්‍රතිපාදන භාවිතා කරනු ලැබුවේ මධ්‍යස්ථානවල ඇති ගොඩනැගිලි හා පොකුණු පුනරුත්ථාපනය සහ පිළිසකර කිරීම, ස්ථාවර වත්කම් මිලදි ගැනිම්, වාහන හා උපකරන පුනරුත්ථාපනය සහ ජලජීවී වගා සංවර්ධන කටයුතු සඳහා යෙදවීමටය.

## 10. වෙනත් නියෝජිත ආයතන සමඟ සම්බන්ධතා

පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමණාකාර වැඩසටහන සහ පශ්චාත් සුනාමි ජීවනෝපාය සංවර්ධනය හා සහයෝගිතා වැඩසටහන සහ ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය යටතේ ජලජීවී වගා ක්ෂේත්‍රයෙහි සංවර්ධන සඳහා විශේෂ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. එයට අමතරව සහ පෞද්ගලික අංශය සමඟ කිවුල්දිය ඉස්සන් අභිජනනාගාරයක්, ආදර්ශ ඉස්සන් ගොවිපලක්, වාකරේ ප්‍රදේශයේ පොකුරු ක්‍රමයට ඉස්සන් වගාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, තව ද වියට්නාම් රජය, මුහුදු පැළෑටි වගාව, මුහුදු කැකිරි අභිජනනය සහ වගාව, සහ කකුළුවන් තර කිරීම සදහා තාක්ෂණය සහ සහාය ලබා දෙන ලදි.

## 11. ආයතනය එළඹ ඇති කොන්ත්‍රාත් කෙරෙහි අධ්‍යක්ෂ වරුන්ගේ මැදිහත් වීම

2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය තුලදි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ආයතනය එළඹි ඇති කොන්ත්‍රාත්තු සඳහා ඍජුවම හෝ වක්‍රව මැදිහත්වීම් සිදුකොට නැත.

## 12. විගණකවරු

2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලද්දේ රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි.

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
ශේෂ පත්‍රය

| | සටහන් | 2014 රු | 2013 රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල ,පිරියතර හා උපකරන | 3 | 630,849,630.19 | 623,145,975.77 |
| අභිජනන ක්‍රියාවලියේ හා වෙළඳ වත්කම් | 4 | 133,074,104.93 | 128,240,690.26 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | 47,187,303.03 | 43,678,801.96 |
| ජීව වත්කම් | | 99,950.00 | 99,950.00 |
| | | 811,210,988.15 | 795,165,417.99 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 5 | 22,876,016.69 | 13,673,740.74 |
| තැන්පතු, අත්තිකාරම් හා කලින් ගෙවීම් | 6 | 2,989,487.93 | 2,992,755.62 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 7 | 37,938,286.82 | 36,972,750.76 |
| මුදල් හා මුදලට සමාන දෑ | 8 | 11,591,440.47 | 5,932,847.88 |
| | | 75,395,231.91 | 59,572,095.00 |
| **මුළු වත්කම්** | | 886,606,220.06 | 854,737,512.99 |
| **හිමිකම් හා බැරකම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රාග්ධන හා වෙන් කිරීම් | | | |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන | | 207,003,656.89 | 139,230,329.73 |
| රඳවා ගත් ඉපැයිම් | | (205,564,085.89) | (179,236,244.07) |
| | | 17,400,000.00 | 17,400,000.00 |
| **මුළු හිමිකම්** | | 18,839,571.00 | (22,605,914.34) |
| **බැරකම්** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝශිත බැදීම් | 9 | 53,562,763.88 | 41,231,660.82 |
| විලම්භිත ආදායම් | 10 | 702,648,721.18 | 733,761,651.03 |
| කොන්ත්‍රාත් මත රඳවා ගැනිම් | | 21,930,997.83 | 12,297,381.84 |
| රාජ්‍ය ප්‍රදාන ව්‍යාපෘති (2006 අයවැය යෝජනා) | | 54,040,042.00 | 54,040,042.00 |
| | | 832,182,524.89 | 841,330,735.69 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 11 | 35,584,124.16 | 35,290,290.60 |
| බැංකු අයිරාව | 12 | 0.00 | 722,401.04 |
| | | 35,584,124.16 | 36,012,691.64 |
| **මුළු බැරකම්** | | 867,766,649.05 | 877,343,427.33 |
| **මුළු හිමිකම් හා බැරකම්** | | 886,606,220.06 | 854,737,512.99 |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | |
| ශුද්ධ ලාභ / අලාභ | (26,327,841.81) | (9,111,372.79) |
| ගැලපීම් | | |
| ක්ෂය - ස්ථාවර වත්කම් | 33,768,364.43 | 39,596,018.13 |
| ක්ෂය - අභිජනන උපකාර | 24,571,238.26 | 22,772,408.84 |
| අඩමාන ණය | 1,057,742.08 | 195,186.37 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 14,422,874.81 | 6,718,419.92 |
| පෙර වර්ෂ ගැලපීම් | - | (569,227.61) |
| හිඟ සේ.අ.අ. හා සේ.භා.අ.ගෙවීම් | - | (4,561,854.85) |
| වත්කම් විකුණුම් මත ලාභ | (3,260,187.96) | (3,138,000.00) |
| විලම්භිත ණය | (58,339,602.69) | (62,497,731.05) |
| කාරක ප්‍රාග්ධන ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය | (14,107,412.88) | (10,596,153.04) |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | (9,202,275.95) | (2,425,567.74) |
| (වැඩිවීම්) / අඩුවීම් අත්තිකාරම් හා කලින් ගෙවීම් | 3,267.69 | 1,527,671.45 |
| (වැඩිවීම්) / අඩුවීම් ණය ගැති හා අනෙකුත් ලැබීම් | (2,023,278.14) | (9,012,328.17) |
| (අඩුවීම් ) / වැඩිවීම් කොන්ත්‍රාත් මත රඳවා ගත් ලැබීම් | 9,633,615.99 | (2,833,667.26) |
| අඩුවීම් ) / වැඩිවීම් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 293,833.56 | 9,838,781.83 |
| මෙහෙයුම් කටයුතු වලින් උපයන ලද මුදල් | (15,402,249.73) | (13,501,262.93) |
| පාරිතෝෂිත ගෙවීම් | (2,091,771.75) | (1,858,108.71) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **(17,494,021.48)** | **(15,359,371.64)** |
| ***ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය*** | | |
| දේපළ පිරියත හා මිලට ගැනුම් | (27,226,672.84) | (106,170,286.42) |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | (47,187,303.03) | 34,696,196.24 |
| ආයෝජන | - | - |
| දේපළ පරියත ඉවත් කිරීම් | 3,288,990.98 | 3,138,000.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය | **(71,124,984.89)** | **(68,336,090.18)** |
| ***මූල්‍ය කටයුතු මත මුදල් ප්‍රවාහය*** | | |
| ප්‍රාග්ධනය ප්‍රතිපාදන ලැබීම් (භාණ්ඩාගාර) | 95,000,000.00 | 83,500,000.00 |
| ආදායම් බදු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය | **95,000,000.00** | **83,500,000.00** |
| මුදල් , මුදල් හා සමාන ෛවතමයන්ගෙන් වූ ශුද්ධ වැඩිවීම් / අඩුවීම් | **6,380,993.63** | **(195,461.82)** |
| වර්ෂ ආරම්භක මුදල් , මුදල් හා සමාන ෛවතමයන්ගේ වටිනාකම | **5,210,446.84** | **5,405,908.66** |
| වර්ෂ අවසාන මුදල් , මුදල් හා සමාන ෛවතමයන්ගේ වටිනාකම | **11,591,440.47** | **5,210,446.84** |
| ***මුදල්, මුදල් හා සමාන ෛවතමයන්ගේ විග්‍රහය*** | | |
| වර්ෂ අවසානයට | | |
| බැංකු ශේෂය | 11,591,440.47 | 5,932,847.88 |
| මුදල් ශේෂය ( අතැති මුදල්) | - | - |
| | 11,591,440.47 | 5,932,847.88 |
| බැංකු අයිරාව | - | 722,401.04 |
| | **11,591,440.47** | **5,210,446.84** |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | රාජ්‍ය ප්‍රදානයන් | | වත්කම් ප්‍රත්‍යාගණන අරමුදල | රඳවා ගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | | | |
| 2013.01.01 දිනට ශේෂය | - | 161,900,616.15 | 17,400,000.00 | (165,260,153.60) | 14,040,462.550 |
| රාජ්‍ය ප්‍රදානයන් | 208,441,000.00 | 83,500,000.00 | - | - | 291,941,000.000 |
| විලම්භිත ආදායමට මාරු කිරීම් (2013 වර්ෂයට අදලව) | - | (106,170,286.42) | 0.00 | - | (106,170,286.420) |
| ලාභාලාභ ගිණුමට මාරු කිරීම් | (208,441,000.00) | - | - | - | (208,441,000.000) |
| වර්ෂයේ ශුද්ධ ලාභ/අලාභ | - | - | - | (9,111,372.79) | (9,111,372.794) |
| එකතු කළා : පෙර වර්ෂ ගැලපීම් | | | | (4,561,854.85) | (4,561,854.850) |
| අඩු කළා : පෙර වර්ෂ ගැලපීම් | - | - | - | (302,862.83) | (302,862.830) |
| **2013.12..31 දිනට ශේෂය** | **-** | **139,230,329.73** | **17,400,000.00** | **(179,236,244.07)** | **(22,605,914.34)** |
| | | | | | |
| 2014.01.01 දිනට ශේෂය | - | 139,230,329.73 | 17,400,000.00 | (179,236,244.07) | (22,605,914.344) |
| රාජ්‍ය ප්‍රදානයන් | 215,200,000.00 | 95,000,000.00 | 0.00 | - | 310,200,000.000 |
| විලම්භිත ආදායමට මාරු කිරීම් (2014 වර්ෂයට අදලව) | - | (27,226,672.84) | 0.00 | - | (27,226,672.840) |
| ලාභාලාභ ගිණුමට මාරු කිරීම් | (215,200,000.00) | - | - | - | (215,200,000.000) |
| වර්ෂයේ ශුද්ධ ලාභ/අලාභ | - | - | - | (26,327,841.81) | (26,327,841.811) |
| **2014.12..31 දිනට ශේෂය** | **-** | **207,003,656.89** | **17,400,000.00** | **(205,564,085.89)** | **18,839,571.00** |

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2014 රු | 2013 රු |
|---|---|---|---|
| ආදායම | | 57,134,456.49 | 56,294,720 |
| මත්ස්‍ය අභිජනන ක්‍රියාවලියේ පිරිවැය | 13 | (60,305,735.58) | (73,263,608) |
| දළ අලාභය | | **(3,171,279.09)** | **(16,968,887)** |
| වෙනත් ආදායම | 14 | 43,320,266.49 | 43,075,941 |
| රාජ්‍ය ප්‍රදානයන් (පුනරාවර්ථන) | | 215,200,000.00 | 208,441,000 |
| | | **255,348,987.40** | **234,548,053** |
| ආයතනික හා පරිපාලන වියදම් | 15 | (297,409,553.89) | (264,472,961) |
| බෙදාහැරීමේ වියදම් | 16 | (42,539,556.56) | (41,609,898) |
| මුල්‍ය සහ වෙනත් වියදම් | 17 | (67,321.46) | (74,299) |
| | | **(340,016,431.90)** | **(306,157,157)** |
| විලම්භිත ආදායම් ගැලපීමට පෙර දළ අලාභය | | **(84,667,444.50)** | **(71,609,104)** |
| විලම්භිත ආදායම් | 10 | **58,339,602.69** | **62,497,731** |
| ශුද්ධ අලාභය | | **(26,327,841.81)** | **(9,111,373)** |

# ගිණුම්කරණසටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු

ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය 1998 අංක 53 දරණ පනතින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇත. ප්‍රධාන කාර්යාලය අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා ව්‍යාපාර ස්වභාවය

අදාල වර්ෂයේදී ද ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ මත්ස්‍ය බීජ අලෙවිය වේ.

## 2 ඉදිරිපත් කිරිමේ පදනම

ගිණුම් වාර්තා ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන ඉදිරිපත් කර ඇත. වර්ෂය තුල දී වත්කම් තුල ප්‍රත්‍යාගනන අගයන් ගැලපීම් හා උද්ධමනකාරි සාදක සදහා ගැලපීම් සිදුකර නැත.

### 2.1 ගිණුම් වාර්තා ඉදිරිපත් කිරිම

අධිකාරියේ ගිණුම් වාර්තා පොදුවේ පිලිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අධිකාරිය ස්ථාපිත කල 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරි පනතේ අවශ්‍යතාවය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන මත සකස් කර ඇත.

### 2.2 සංසන්ධනාත්මක තොරතුරු

අධිකාරිය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ආදේශකර ඇති අතර පෙර වර්ෂවල භාවිතා කල ප්‍රතිපත්ති හා සැසදේ.

## 3 ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය පිලිබද සාරාංශය

### 3.1 වෙළද හා අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළද කටයුතු වලින් ලැබිය යුතු දෑ බොල්ණය හා අඩමාන ණය ගැලපීම් වලින් පසු ශුද්ධ වටිනාකම පෙන්නුම්කර ඇත. අනෙකුත් ලැබිය යුතු දෑ පිරිවැය මත හදුනාගෙන ඇත.

### 3.2 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල්සේ ඉදිරිපත් කර ඇත.

### 3.3 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් හැර අනෙකුත් වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ වටිනාකම පෙන්වා ඇත. වත්කමේ ජීව කාලය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ඇත. ක්ෂය ප්‍රතිශතයන් පහතින් දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 4% |
| වාහන | 20% |
| ලි බඩු සහ කාර්යාලීය | 10% |
| රසායනාගාර උපකරණ | 10% |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 10% |
| අභිජනනාගාර උපකරණ | 10% |
| මත්ස්‍ය තටාක | 10% |
| මත්ස්‍ය පොකුණු | 6% |
| උපකරණ සහ උපාංග | 10% |
| පරිගණක හා පණිඩවුඩ භුවමාරු උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග | 10% |

*සටහන*

අධිකාරියේ හෙක්ටයාර 6.8799 ක ඉඩම් ස්ථාවර වත්කම් ලෙස ලබාගෙන නැත්තේ තක්සේරු කටයුතු සඳහා තක්සේරු දෙපාර්තමේන්තවට භාරදී ඇතත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන ප්‍රත්‍යාගනන වාර්තා ලැබී නොමැති බැවිනි.

### 3.4 අඩමානණය

වර්ෂ අවසානයේ ඇති ණයගැති ශේෂයෙන් 10% ක් අඩමාන ණය ලෙස වෙන්කර ඇත.

### 3.5 තොග

තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගණනය කර ඇත.

### 3.6 විශ්‍රාම පාරිතෝෂිත

*පාරිතෝෂිත බැදීම් අර්ථ දැක්වීම*

පාරිතෝෂිත ගණනය කර ඇත්තේ සේවයට බැදුනු දින සිට වර්ෂයට මාස 1/2 දල වැටුප බැගිනි. නමුත් 1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත අනුකූලව අධිකාරියේ වසර 5 ක් අඛණ්ඩව සේවයේ නියුක්ත නිලධාරීන් පමණක් පාරිතෝෂිත ලබාගැනීම සඳහා නීතියානුකූලව බැදේ.

*දායකත්ව සැලසුම අර්ථ දැක්වීම-සේවක අර්ධ සාදක හා සේවක භාරකාර අරමුදල*

සේවකයන් සේවක අර්ධ සාදක අරමුදලට දායකවීම අනිවාර්ය අතර සේවක භාරකාර අරමුදල අදාල රෙගුලාසි අනුව සිදුකෙරේ. අධිකාරිය සේවක අර්ධ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දල ඉපැයීම්වලින් 15% ක හා 3% ක දායකත්වය දරනු ලබයි.

### 3.7 ආදායම් හඳුනා ගැනීම

ලැබිය යුතු හා ලද ආදයම සාධාරණ අගය මත සලකා ආදායම් ලෙස ගණනය කර ඇත.

### 3.8 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත්තේ එක් එක් ආදායම් ඉපැයීම් සඳහා දරා ඇති වියදම්වේ. සියලුම නිශ්පාදන ක්‍රියාවලිය සඳහා දරන ලද වියදම් හා දේපල ,පිරියත හා උපකරණ කාර්යක්ෂම භාවිතය සඳහා නඩත්තු කිරීම් ආදායමට අයකිරීම තුලින් වර්ෂයට අදාල ලාභ/අලාභ අගය පැමිණ ඇත.

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

2014 දෙසැම්බර් මස 31 දිනට ස්ථාවර වත්කම්

**දේපල පිරියත හා උපකරන**

| පිරිවැය | 2014.01.01 දිනට ශේෂය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | 146,411,854.00 | - | - | 146,411,854.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 344,538,375.10 | 37,235,210.97 | - | 381,773,586.07 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (ADB) | 206,460,717.00 | - | - | 206,460,717.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (නව ගොඩනැගිල්ල ) | 3,184,404.00 | - | - | 3,184,404.00 |
| ලිබඩු සහ කාර්යාලීය | 30,610,134.53 | 2,044,846.69 | - | 32,654,981.22 |
| ලිබඩු සහ කාර්යාලීය (ADB) | 4,911,820.00 | - | - | 4,911,820.00 |
| රසායනාගාර උපකරණ | 8,610,082.80 | 1,527,400.00 | - | 10,137,482.80 |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 22,269,706.06 | 249,144.60 | - | 22,518,850.66 |
| පරිභෝජන ද්‍රව්‍ය සහ විවිධ උපකරණ | 10,137,648.96 | - | - | 10,137,648.96 |
| උපකරණ සහ උපාංග | 1,573,467.00 | - | - | 1,573,467.00 |
| වාහන | 56,537,608.11 | 1,791,905.80 | 1,701,112.00 | 56,628,401.91 |
| වාහන (ADB) | 42,226,474.00 | 954,300.00 | 4,347,500.00 | 38,833,274.00 |
| පරිගණක හා පණිවුඩ හුවමාරු උපකරණ | 7,559,913.99 | 1,196,041.00 | - | 8,755,954.99 |
| පරිගණක මෘදුකාංග | 1,155,625.00 | - | - | 1,155,625.00 |
| | **886,187,830.55** | **44,998,849.06** | **6,048,612.00** | **925,138,067.61** |

| ක්ෂය | 2014.01.01 දිනට ශේෂය | වර්ෂය තුල ක්ෂය කිරීම් | වර්ෂය තුල ක්ෂය ඉවත් කිරීම් හා ගැලපීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් | - | - | - | 0.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 91,224,217.88 | 13,781,535.79 | - | 105,005,753.67 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (ADB) | 41,292,144.04 | 8,258,428.04 | - | 49,550,572.08 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (නව ගොඩනැගිල්ල ) | 3,184,404.00 | - | - | 3,184,404.00 |
| ලිබඩු සහ කාර්යාලීය | 16,832,804.75 | 2,150,054.85 | - | 18,982,859.60 |
| ලිබඩු සහ කාර්යාලීය (ADB) | 2,455,910.00 | 491,182.00 | - | 2,947,092.00 |
| රසායනාගාර උපකරණ | 6,259,650.92 | 605,312.40 | - | 6,864,963.32 |
| යාන්ත්‍රික සහ අනෙකුත් උපකරණ | 13,909,330.53 | 898,727.19 | - | 14,808,057.72 |
| පරිභෝජන ද්‍රව්‍ය සහ විවිධ උපකරණ | 6,317,163.20 | 1,027,258.94 | - | 7,344,422.14 |
| උපකරණ සහ උපාංග | 1,573,467.00 | (465.71) | - | 1,573,001.29 |
| වාහන | 34,164,301.79 | 6,016,400.12 | 718,008.98 | 39,462,692.93 |
| වාහන (ADB) | 41,864,774.40 | (329,000.40) | 2,702,500.00 | 38,833,274.00 |
| පරිගණක හා පණිවුඩ හුවමාරු උපකරණ | 3,732,738.05 | 1,656,258.41 | - | 5,388,996.46 |
| පරිගණක මෘදුකාංග | 230,948.22 | 111,400.00 | - | 342,348.22 |
| | **263,041,854.78** | **34,667,091.62** | **3,420,508.98** | **294,288,437.42** |
| ලියාහල අගය | **623,145,975.77** | | | **630,849,630.19** |

**අභිජනන ක්‍රියාවලියට අදාල වත්කම්**

| පිරිවැය | 2014.01.01 දිනට ශේෂය | වර්ෂය තුල ඔකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| අභිජනනාගාර උපකරණ | 9,025,731.00 | 3,258,014.87 | - | 12,283,745.87 |
| අභිජනනාගාර උපකරණ (ADB) | 84,246,743.00 | - | - | 84,246,743.00 |
| මත්ස්‍ය තටාක | 13,726,094.00 | 15,055,877.19 | - | 28,781,971.19 |
| මත්ස්‍ය පොකුණු | 215,801,276.52 | 10,192,033.68 | - | 225,993,310.20 |
| | **322,799,844.52** | **28,505,925.74** | **-** | **351,305,770.26** |

| ක්ෂය | 2014.01.01 දිනට ශේෂය | වර්ෂය තුල ක්ෂය කිරීම් | වර්ෂය තුල ක්ෂය ඉවත් කිරීම් හා ගැලපීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| අභිජනනාගාර උපකරණ | 5,832,783.02 | 353,581.93 | - | 6,186,364.95 |
| අභිජනනාගාර උපකරණ (ADB) | 25,274,022.60 | 8,424,674.60 | - | 33,698,697.20 |
| මත්ස්‍ය තටාක | 5,683,817.70 | 2,793,525.10 | - | 8,477,342.80 |
| මත්ස්‍ය පොකුණු | 157,768,530.94 | 12,100,729.44 | - | 169,869,260.38 |
| | **194,559,154.26** | **23,672,511.07** | **-** | **218,231,665.33** |
| ලියාහල අගය | **128,240,690.26** | | | **133,074,104.93** |